# 08. දසසික්ඛාපදනි

## අට්ඨමො පාඨො



බුද්ධං සරණං ගච්ඡාමි.

ධම්මං සරණං ගච්ඡාමි.

සංඝං සරණං ගච්ඡාමි.

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.

දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.

දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි.

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.

තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.

තතියම්පි සංඝං සරණං ගච්ඡාමි.

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමේරයමජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
6. විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
7. නච්චගීතවාදිතවිසූකදස්සනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
8. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
9. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
10. ජාතරූපරජතපටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

## වචන මාලාව

1. දුතියං - දෙවනුව
2. තතියං - තෙවනුව
3. සරණ - පිහිට, සරණ
4. අට්ඨ - අට
5. අපි - ද
6. පාණාතිපාත - ප්‍රාණඝාතය
7. අදින්නාදාන - නොදුන් දේ ගැනීම
8. අබ්‍රහ්මචරිය - බඹසර නො හැසිරීම
9. මුසාවාද - බොරුකීම
10. සුරාමෙරය - රහමෙර

11. මජ්ජ - මදය
12. නච්ච - නැටීම
13. විසූකදස්සනා - විහිළු දර්ශන
14. විලේපන - විලවුන්
15. ජාතරූපරජත - රන්රිදී මසු කහවණු
16. පටිග්ගහණ - පිළිගැනීම

## දුතියා විභක්තිය

**අහං <u>බුද්ධං සරණං</u> ගච්ඡාමි**

මෙම වගන්තියේ ''**බුද්ධං සරණං**'' යන පද දෙක ම යෙදී ඇත්තේ දුතියා විභක්තියෙනි. වාක්‍යයක සාමාන්‍යයෙන් පද දෙකක් හෝ තුනක් වත් තිබේ.

| ක්‍රියාව කරන්නා | කරන දෙය | ක්‍රියා පදය |
|---|---|---|

- මේ පද තුනෙන් ''**<u>කරන දෙය</u>**'', අපි පාලියෙන් යොදන විට දුතියා විභක්තියෙන් යොදමු.
- කුම්භකාරො ඝටං කරොති
  (කුඹල්කරු කළය සාදයි.)
- අහං <u>බුද්ධං සරණං</u> ගච්ඡාමි
  (මම බුදුරජාණන් වහන්සේ සරණ යමි.)
- මේ වගන්තවල ක්‍රියාපද ''**සාදයි**'' ''**යමි**'' යනුවෙන් ඇත. එම නිසා ''**කරන දෙය**'' දක්වූ හා පැමිණෙන තැන දක්වෙන පද දුතියා විභක්තියෙන් යොදනු ලැබිණි. මේ අනුව ක්‍රියාවෙන් යටත් වන පද දුතියාවෙන් යෙදේ.

දුතියා විභක්ති පද වාක්‍යවල යෙදෙන අයුරු බලන්න.

- අහං <u>චන්දං</u> පස්සාමි - මම සඳ බලමි.
- සිස්සො <u>භත්තං</u> භුඤ්ජති - ශිෂ්‍යයා බත් අනුභව කරයි.
- ආචරියො <u>අක්ඛරං</u> ලිඛති - ගුරුවරයා අකුරක් ලියයි.
- මිත්තො <u>ගාමං</u> ගච්ඡති - මිත්‍රයා ගමට යයි.
- අස්සො නගරං ධාවති - අශ්වයා නගරයට දුවයි.

දුතියා විභක්තියේ නාම වරනැගෙන අයුරු බලන්න.

| දුතියා විභක්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධං | බුද්ධෙ |
| අග්ගි | අග්ගිං | අග්ගී, අග්ගයො |
| දණ්ඩී | දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| භික්ඛු | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| කඤ්ඤා | කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො |
| නදී | නදිං | නදී, නදියො, නජ්ජො |
| චිත්ත | චිත්තං | චිත්තෙ, චිත්තානි |
| සබ්බ | සබ්බං | සබ්බෙ |
| ඉම | ඉමං | ඉමෙ |

## අභ්‍යාසය 08 1

1. සිංහලට නගන්න.

    1. ධනපාලො ගෙහං ගච්ඡති.
    2. දාසො රුක්ඛං ඡින්දති.
    3. සූදො භත්තං පචති.
    4. යාචකො ඔදනං යාචති.
    5. මනුස්සා කම්මානි කරොන්ති.

2. පාලියට නගන්න.

    1. ගොවියා කුඹුරට යයි.
    2. කම්කරුවා වැඩ කරයි.
    3. ගොපල්ලා එළුවෙකු ගෙන යයි.
    4. දරුවා මලක් කඩයි.
    5. භික්ෂුව පන්සලට වඩියි.

3. ඔබ දන්නා දුතියා විභක්ත්‍යන්ත පද යොදාගෙන වගන්ති 5ක් නිර්මාණය කරන්න.

4. මේ පදවල දුතියා විභක්ත්‍යන්ත රූප ලියන්න.

    1. නර (මිනිසා)
    2. කපි (වඳුරා)
    3. ආචරිය (ගුරුවරයා)
    4. පඤ්ඤා (ප්‍රඥාව)
    5. ඵලං (ගෙඩිය)

5. දුතියා විභක්ති නාමපද වගුව ශබ්දනගා කියවන්න.

මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න

| උකාරාන්ත පුලලිඞග ''භික්ඛු'' ශබ්දය (භික්ෂුව) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| ආලපන | (භෙ) භික්ඛු | (භවන්තො) භික්ඛූ, භික්ඛවෙ, භික්ඛවො |
| දුතියා | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| තතියා | භික්ඛුනා | භික්ඛූභි, භික්ඛූහි |
| කරණ | භික්ඛුනා | භික්ඛූභි, භික්ඛූහි |
| චතුත්ථි | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| පඤ්චමී | භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූභි, භික්ඛූහි |
| ඡට්ඨී | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| සත්තමී | භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛුසු, භික්ඛූසු |